සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
,உணஷலஹகஷ ஜடஇண கஜபகஷகப்ல் - 2018
Second Term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | පැය / மணித்தியாலம் / Hours: 02 |

නම
பெயர் ------------------------------------------------------------------------
Name

- පළමුවන කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ 1, 2 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

(01) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ජනගහණය, වෙරලාසන්න (2) ප්‍රස්ථාවනාව, නිශ්ඵල

(3) කොට්ඨාසය, සංරක්ෂණය (4) ගවේශණය, භාෂනය

(02) මූර්ධජ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ත, ථ, ද, ධ, න (2) ට, ඨ, ඩ, ඪ, ණ

(3) ප, ඵ, බ, භ, ම (4) ක, ඛ, ග, ඝ, ඞ

(03) අකාරාදි පිළිවෙළට නම් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) කඩුගන්නාව, කතරගම , පුත්තලම, මඩකලපුව

(2) කුරුණෑගල, කෑගල්ල, වවුනියාව, ගම්පහ

(3) අනුරාධපුරය, අත්තනගල්ල, මහනුවර, මයියංගනය

(4) රත්නපුර, යාපනය, මීගමුව, ගාල්ල

(04) මුලින් දී ඇති පදයෙහි සමානාර්ථවත් පද ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.

(1) සුළඟ - පවන, මාරුතය, අනිල, මරු

(2) ජලය - උදක, පැන්, වාරි, දිය

(3) වියත් - දක්ෂ, විදග්ධ, ප්‍රවීණ, උගත්

(4) විසම - සම, තුල්‍ය, තුල්, විසල්

(05) මුලින් දී ඇති පදයෙහි විරුද්ධාර්ථය නිවැරදි ව දක්වෙන පිළිතුරු යුගලය තෝරන්න.

(1) උන්නතිය - පරිහානිය (2) කයෝර - දෘඪ

(3) සංකල්පය - විකල්පය (4) පරිමිත - අපරිමිත

(1) 1 හා 4 ය (2) 2 හා 4 ය

(3) 1 හා 3 ය (4) 1 හා 2 ය

(06) මුලින් දී ඇති පදයෙහි බහු අර්ථ ප්‍රකාශ වන පිළිතුර තෝරන්න.

(1) උතුම් - උසස්, උත්තම, සෙට, ශ්‍රේෂ්ඨ (2) සර - විල, ස්වරය, ශබ්දය, ඊතලය

(3) ගත - මනස, වත, කත, අත (4) තුට - ප්‍රීතිය, ප්‍රමෝදය, සොම්නස, දූල

(07) පහත දක්වෙන වාක්‍යයේ ඉරි ඇඳි කොටසෙහි අර්ථය නිවැරදි ව ඇති පිළිතුර තෝරන්න.

කාර්යාල සහායක ඉවක් බවක් නැති ව වැඩ කිරීම නිසා ලිපි ගොනු අවුල් වී ඇති බව ලිපිකරුවෝ පවසති.

(1) කලබලයෙන් (2) වැරදි අයුරින්

(3) නොසැලකිල්ලෙන් (4) කපටි ලෙස

(08) නිෂ්ඵල උත්සාහයක් ගැනීම සම්බන්ධ ව යෙදිය හැකි ප්‍රස්තාව පිරුළ වන්නේ

(1) කළුවා මාරපන ගියා වගෙයි (2) කුනිස්සන්ට දෑල් දම්මා වගේ

(3) කිරිගහට ඇන්නා වගේ (4) කබලෙන් ළිපට වැටුණා වගේ

(09) පහත වාක්‍යවල නාම විශේෂණයක් හා ක්‍රියා විශේෂණයක් නොමැති වාක්‍යය තෝරන්න.

(1) සුන්දර දිය ඇලි වේගයෙන් පහළට වැටෙයි.

(2) යහපත් මිනිස්සු සාමකාමී ව ජීවත් වෙති.

(3) සිඟිති දැරිය සතුටින් සිනාසුණා ය.

(4) උපාසිකාව මල් පූජා කළා ය.

(10) අපූර්ව ආකාරයෙන් නිර්මාණ කිරීමේ හැකියාව යන අදහසට දෙන තනි පදය වන්නේ,

(1) ප්‍රතිනිර්මාණය (2) මනඃකල්පිත

(3) අග්‍රගණ්‍ය (4) ප්‍රතිභාව

(11) යම් කිසි දෙයක සැබෑ තත්ත්වය ප්‍රකාශ කිරීම,

(1) අතිශයෝක්තිය (2) ස්වභාවෝක්තිය

(3) පුනරෝක්තිය (4) ව්‍යාංග්‍යාර්ථය

(12) නිත්‍ය බහු වචන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ගායිකාවක්, සතුන් (2) ළමයි, ලේඛකයෝ

(3) සමහරු, ඇතමෙක් (4) හෙතෙම, ඔවුහු

(13) ''අ'' කොටසේ පදවල අර්ථය ''ආ'' කොටසින් ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ වන්නේ

| ''අ'' | ''ආ'' |
| --- | --- |
| ප්‍රගමනය | A. වැරදි මාර්ගයේ |
| අනුභූතිය | B. කුඩා දියවළකි |
| අසත්පථයේ | C. දියුණුව |
| කිඳළෙකි | D. අත්දැකීම |

(1) B,A,C,D (2) C,D,A,B

(3) A,C,B,D (4) B,A,C,D

(14) සිංහල භාෂාවේ **''වබු වදන්''** ලෙස හැඳින්වෙන්නේ

(1) සමානාර්ථ පද යි (2) දුරවබෝධ පද යි

(3) විශේෂණ පද යි (4) පාරිභාෂික පද යි

(15) ''අ'' තීරුවේ දක්වා ඇති ධීවර භාෂාවේ යෙදෙන පද සඳහා පොදු ව්‍යවහාරය නිවැරදි ව දැක්වෙන පිළිතුරු යුගලය වන්නේ

| ''අ'' | ''ආ'' |
|---|---|
| ඉයත්තුව | A. කාලගුණය |
| මාරියාව | B. සුළඟ |
| ජාලියෝ | C. මාළු වෙළෙන්දෝ |
| කෝඩය | D. වර්ෂාව |

(1) A D ය  (2) A C ය  (3) B C ය  (4) C D ය

(16) අනියමාර්ථ උක්ත නාම පද ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) කුරුල්ලෝ, මුවන්  (2) සොහොයුරියක්, වෘක්ෂයක්

(3) ඔවුන්, වීරයන්  (4) දියණියක, නායකයෙකු

(17) ''ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන
ඔබේ සිරිපා දොවන්නම් ''

ඉහත ගීත කොටස ඇතුළත් ගීතයේ රචකයා වන්නේ

(1) සුනිල් ආරියරත්න මහතා ය  (2) ඩබ්.ඒ. අබේසිංහ මහතා ය

(3) මහගමසේකර මහතා ය  (4) ඩබ්.ඩී. අමරදේව මහතා ය

(18) පහත සඳහන් වාක්‍ය අතුරෙන් **වැරදි** ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ''මධ්‍ය කාලීන සිංහල කලා '' කෘතිය ආනන්ද කුමාරස්වාමි මහතාගේ නිර්මාණයකි.

(2) සුබස සඟරාවේ නිර්මාතෘවරයා කුමාරතුංග මුණිදාස මහතා ය.

(3) ඔවා මුතු දම ආනන්ද රාජකරුණාගේ කාව්‍ය සංග්‍රහයකි.

(4) කෝමල රේඛා ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතාගේ නිර්මාණයකි.

(19) ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

(1) දද පෙළ නගරය අලංකාර කරති.

(2) පුතණුවෝ වැඩිහිටියන්ගේ අවවාද පිළිපදිති.

(3) නූතන කවීන් සමාජ ගැටලු තේමා කරගෙන නිර්මාණ ලියයි.

(4) සමහරෙක් අවංක ව වැඩ කරනු ලැබේ.

(20) (1) ලේඛකයෝ විසින් පොත් ලියනු ලබයි.

(2) මා විසින් ඔවුහු දකින ලදි.

(3) ගුරුවරුන් විසින් ශිෂ්‍යයෝ යහමග යවනු ලබති.

(4) දූරිය විසින් මල් පුදන ලදහ

(ලකුණු 2x20=40)

## II කොටස

- *1 හා 2 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.*

(01) පන්ති කාමරයේ දී ඇගයීම් ප්‍රභේදයක් ලෙස සකස් කළ පද්‍ය සංග්‍රහය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඔබ පද්‍ය සංග්‍රහයට ඉදිරිපත් කළ නිර්මාණයේ මාතෘකාව කුමක් ද? (ල.02)
2. ඔබේ නිර්මාණය සකස් කිරීමේ දී ඔබට ගුරුවරයාගෙන් ලැබුණු උපදෙස් **දෙකක්** ලියන්න. (ල.04)
3. නිර්මාණය සාර්ථක කර ගැනීම සඳහා ඔබ අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල.04)
4. ඔබේ නිර්මාණයෙන් ඔබ ලබා දුන් පණිවිඩය **එක් වාක්‍යකින්** ලියන්න. (ල.02)
5. නිර්මාණය සකස් කිරීමෙන් ඔබට ලැබුණු හැකියා **දෙකක්** ලියන්න. (ල.02)

**(ල.16)**

(02) පහත දැක්වෙන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 200ක පමණ රචනයක් ලියන්න.

1. අනාදිමත් කාලයක සිට පැවත එන ආගමික හා ජාතික උත්සවවලින් අපේ රටේ සංස්කෘතියේ වැදගත් පැතිකඩක් නිරූපණය වේ. එමෙන් ම ජනයා අතර සාමය සාමූහිකත්වය සහජීවනය වර්ධනය වේ. ''අපේ ජාතික ආගමික උත්සව'' යන මාතෘකාවෙන් රචනයක් ලියන්න.

2. වර්තමානයේ ජනතාව බොහෝ සෙයින් ක්ෂණික ආහාර පානවලට පුරුදු වී සිටිති. එහෙත් ඒවායින් වන අනිටු ප්‍රතිවිපාක බොහෝ ය. නිරෝගිමත් ජීවිතයක් සඳහා අප ස්වාභාවික ආහාර පානවලට හුරුපුරුදු විය යුතු ය. ''ස්වාභාවික ආහාර ගැනීමේ වැදගත්කම'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

3. මිනිසාගේ අදූරදර්ශී ක්‍රියාකලාප නිසා ස්වාභාවික පරිසරය අකාරුණික වී ඇත. දිනෙන් දින ගංවතුර නාය යෑම් ආදී විපත්වලට මුහුණ දී ජනතාව අසරණ භාවයට පත් වී ඇත. ''ස්වාභාවික විපත් අවම කර ගනිමු'' මාතෘකාවෙන් රචනයක් ලියන්න.

4. ජංගම දූරකථනය ළමා පරපුර බොහෝ ප්‍රිය කරන සන්නිවේදන මාධ්‍යයකි. එහෙත් මෙය අනිසි ලෙස භාවිත කිරීම නිසා ළමයින් විවිධ ව්‍යවසනවලට ගොදුරු වෙති. මේ කරුණ සලකා ''ජංගම දූරකථනය හා ළමා පරපුර'' තේමාවෙන් රචනයක් ලියන්න.

5. නවීන තාක්ෂණය ඔස්සේ ලෝකය දියුණු යැයි සිතුව ද මිනිස් සිත් සතන් තුළ වර්ධනය විය යුතු සාරධර්ම කෙමෙන් පරිහානියට පත්වන අයුරු දක්නට ලැබේ. මෙයින් සිදුවනුයේ බරපතල ව්‍යසනයකි. ''සාරධර්ම සුරකිමු'' මාතෘකාවෙන් රචනයක් ලියන්න.

(ල.14)

(03) ඔබට අවශ්‍ය පරිගණකයක් මිල දී ගැනීම සඳහා එහි මිල ගණන්, විශේෂ වට්ටම්,පරිගණක වර්ග පිළිබඳ ව දන්වන ලෙස ඉල්ලමින් කොළඹ 08, බොරැල්ල, මරදාන පාරේ පිහිටි අබාන්ස් වෙළෙඳ ආයතනයේ කළමනාකරුට යැවීමට සුදුසු ලිපිය ලියන්න.

(ල.10)

(04) පහත සඳහන් ප්‍රකාශ අසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

''අපි නුඹ වහන්සේට පිනට කන්ට බොන්ට සමර්ථ වුම්හ''

1. මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?
2. එය උපුටා ගත් මුල් ග්‍රන්ථය නම් කරන්න.
3. එම ග්‍රන්ථය ලියූ කතුවරයා කවුරුන් ද?
4. රචනා කළ සාහිත්‍ය යුගය කුමක් ද?
5. මුල් ග්‍රන්ථයේ රචනා ශෛලිය කුමක් ද? (ලකුණු 2x5=10)

(05) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියා පදය තෝරා ලියන්න.

1. කාර්යාලයේ සේවකයන්ගෙන් එක් අයෙක් ලබන සතියේ විශ්‍රාම .......... (යනු ලැබේ/යයි/ යති)
2. ඇතමෙක් සමාජයේ දියුණුවට කටයුතු ............ (කරයි/ කරති/කරනු ලබයි)
3. වනජීවී නිලධාරීන් විසින් සත්තු ආරක්ෂා ............. (කෙරෙයි / කරනු ලබය / කරුනු ලබති)
4. තුරු ලතාවෝ සුළඟට ............... (සෙලවෙති/සෙලවෙයි/ සෙලවිණි )
5. වැඩිහිටියන් විසින් අපි (පිළිගන්නා ලදී/පිළිගන්නා ලද්දෙමු / පිළිගන්නා ලදහ)

(ලකුණු 2x5=10)

(06) පහත සඳහන් නිර්මාණ ලියූ ලේඛකයින් නම් කරන්න.

1. සින්දු කියන උණ පඳුර -
2. කාව්‍යශේඛරය -
3. ක්‍රියා විවරණය -
4. රන්තැටියක කඳුළු -
5. නන්දන ගීත -
6. සුබස් මිණි ආර -
7. මඩොල් දූව -
8. කුඩ හොරා -
9. ළමා උයන -
10. මග දිගට ජන කතා -

(ලකුණු 1x10=10)

(07) පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලිය ළඟ තුරු සෙවණැලි මල් ඇඳේ
ලිය ගී කියමින් සැතපී ඉඳේ
ලිය හෝවිලි කෙළනා මන නඳේ
ලිය කිඳුරෝ ඇත එවනෙහි සොඳේ

මත් ගජ රළින් රළ බලව තේ
දෙත් දිගු දළින් දළ නොනැව තේ
යුත් මුව රැළ ඉඳ කෙළිම තේ
බොත් දිය දොළින් දොළ එවන තේ

සබරුන් වල් වදිති යි බිය ගෙ නේ
සෙමරුන් සැඟවුණු තැන් නොම පෙ නේ
ගවරුන් සිටියා දුටු ඒ ව නේ
කවුරුන්ට ද සිත බිය නො වදි නේ

1. පළමු කවියේ සඳහන් ලිය කිඳුරන් කරමින් සිටි ක්‍රියා දෙකක් නම් කරන්න.
2. කිඳුරන් හැරුණ විට වනයේ සිටි වෙනත් සත්ත්ව වර්ග දෙකක් නම් කරන්න.
3. සෙමරුන් සැඟවුණේ කුමක් නිසා ද?
4. රළින් රළ, දොළින් දොළ යන පදවලින් දෙන කාව්‍යාලංකාරය කුමක් ද?
5. පහත වචනවල අර්ථය ලියන්න.

   (අ) ලිය හෝවිලි　　　　(ආ) බලවතේ

(ලකුණු 2x5=10)